# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1837/25 - 2013 නොවැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2013.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු නිවේදනයයි**

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 03/2013

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 21 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

***1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත***

*ආඥාව*

මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දැක්වෙන භාණ්ඩ සම්බන්ධයෙන් ආනයන තීරු ගාස්තු ප්‍රමාණ වෙනස් කිරීමේ සහ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයෙහි විධිවිධාන යටතේ පවත්නා අනුග්‍රහ ලැයිස්තුව හා නිදහස් කරන භාණ්ඩ ලැයිස්තුව ඉවත් කර, ඒ වෙනුවට මෙහි වූ උපලේඛනයෙහි සඳහන් කර ඇති අනුග්‍රහ ලැයිස්තුව හා නිදහස් කරන භාණ්ඩ ලැයිස්තුව ආදේශ කිරීමේ ප්‍රතිඵලය ඇති යෝජනාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති හෙයින්,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම 2013 නොවැම්බර් මස 22 වැනි දින සිට,


1A - PG 1836— 800 (2013/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයෙහි විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අය කළයුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අය කළයුතු බව හා ගෙවිය යුතු බවට ද,

(ආ) (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයෙහි විධිවිධාන යටතේ පවත්නා අනුග්‍රහ ලැයිස්තුව ඉවත්කර ඒ වෙනුවට මෙහි පළමුවන ඇමුණුමෙහි සඳහන් අනුග්‍රහ ලැයිස්තුව ආදේශ කර එම ඇමුණුමෙහි 2 වැනි තීරුවෙහි දක්වා ඇති භාණ්ඩයන් සම්බන්ධයෙන් එහි 3 වැනි තීරුවේ දක්වා ඇති ආනයන තීරු ගාස්තු ප්‍රමාණයන් අනුව තීරු ගාස්තු ගෙවන සේ ඉල්ලා අයකර ගන්නා ලෙස ද,

(ඇ) (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයෙහි විධිවිධාන යටතේ පවත්නා නිදහස් කරන භාණ්ඩ ලැයිස්තුව ඉවත්කර, ඒ වෙනුවට මෙහි දෙවැනි ඇමුණුමෙහි සඳහන් නිදහස් කරන භාණ්ඩ ලැයිස්තුව ආදේශ කර එහි දැක්වෙන භාණ්ඩයන් ආනයන තීරු ගාස්තු වලින් නිදහස් කරන ලෙස ද,

රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය).

2013 නොවැම්බර් මස 21 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.